**<u>රුපියල් මිලියන 2.5 ක් හෝ ඊට වැඩි මුදලක් ශ්‍රී ලංකා මහ බැංකුව අනුමත ඕනෑම වාණිජ බැංකුවක වසර 03 ක කාලයක් සඳහා ස්ථාවරව තැන්පත් කර ඒ අනුව අයදුම් කිරීම.</u>**

**හෝ**

**<u>ශ්‍රී ලංකා මහ බැංකුව අනුමත ඕනෑම වාණිජ බැංකුවක අනේවාසින විදේශ මුදල් ගිණුම් / නේවාසික විදේශ මුදල් ගිණුම් හෝ ජොෂ්ඨ පුරවැසි ස්ථාවර ආයෝජන ගිණුමක ඇමෙරිකානු ඩොලර් 25,000 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් වසර 03ක කාලයක් සඳහා ස්ථාවරව තැන්පත් කර ඒ අනුව අයදුම් කිරීම.</u>**

**හෝ**

**<u>භාණ්ඩාගාර සුරැකුම්පත් (TB)හෝ සුරැකුම්පත් ආයෝජන ගිණුමක (SIA) ඇමෙරිකානු ඩොලර් 25,000 ක් හෝ ඊට වැඩි මුදලක් වසර 03 ක් හෝ ඊට වැඩි කාලයක් සඳහා ආයෝජනය කර ඒ අනුව අයදුම් කිරීම.</u>**

**( අදාල බැංකුවෙන් එම මුදල වසර 03 ක් ඇතුලත ආපසු නොගන්නා බව තහවුරු කර ලබාගන්නා සහතිකය ඉදිරිපත් කළ යුතුවේ.)**

a) අයදුම්පත්‍රය

b) 3.5  x 4.5 cm ප්‍රමාණයේ වර්ණ ඡායාරූප 2 ක්

c) දැනට පුරවැසිභාවය දරනු ලබන රටෙන් ලබාගත් පොලිස් නිශ්කාෂණ සහතිකය (වයස අවුරුදු 16ට වැඩි සියලු දෙනා විසින් අදාළ රටෙහි පොලිස් වාර්තාව ඉදිරිපත් කළ යුතු අතර එම අදාල සහතිකය අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු දිනට මාස 12කට නොවැඩි කාලයක් තුල ලබාගත් ඉංග්‍රීසි භාෂාවෙන් යුතු සහතිකයක් විය යුතු අතර එම සහතිකය ඉංග්‍රීසි භාෂාවෙන් නිකුත් කර නොමැති නම් ඊට අදාල ඉංග්‍රීසි පරිවර්තනය ද සමඟ ඉදිරිපත් කරන්න.)

d) පුරවැසි සහතිකය සහ එහි ඡායා පිටපත (19 (2) වගන්තිය යටතේ පමණි.)

e) වලංගු විදේශ ගුවන් ගමන් බලපත්‍රය/ බලපත්‍ර සහ එහි දත්ත පිටුවේ ඡායා පිටපත් (ස්ථිර වාස විසා කාඩ්පත හෝ එය සනාථ කළ හැකි අදාළ ලියවිලි සහ එහි ඡායා පිටපත් (19(3) වගන්තිය යටතේ ශ්‍රී ලාංකික පුරවැසිභාවය රදවා ගැනීමට අවශ්‍ය අයකු නම් පමණි)

f) ඔස්ට්‍රේලියාව සමඟ 19 (3) වගන්තිය යටතේ ද්විත්ව පුරවැසිභාවය අයදුම්කරන්නේ නම් මාර්ගගත වීසා හිමිකම් සත්‍යාපනය (VEVO) ඉදිරිපත් කළ යුතුය.

g) ස්ථාවර තැන්පතු සහතිකය

h) බැංකු තහවුරු කිරීමේ ලිපිය

i) කලත්‍රයා සඳහා විවාහ සහතිකයේ මුල් පිටපත

j) ශ්‍රී ලංකාවෙන් බැහැරව වෙනත් රටක උපත ලබා ඇත්නම් කොන්සියුලර් උප්පැන්න සහතිකය සහ පුරවැසි පනතේ 5(2) වගන්තිය යටතේ නිකුත් කරන ලද පුරවැසි සහතිකය හා එහි ඡායා පිටපත

k) ශ්‍රී ලංකාවේ උපත ලබා ඇත්නම් උප්පැන්න සහතිකයේ මුල් පිටපත (නම වෙනස් කර ඇත්නම් ඊට අදාළ මුල් ලියවිලි සමඟ ඡායා පිටපත් හෝ උප්පැන්න සහතිකයේ 13 වන තීරුවෙහි සංශෝධනය කළ මුල් පිටපත)

ඉල්ලුම් කිරීමේ ක්‍රමවේදය

- නිසි පරිදි සම්පූර්ණ කළ අයදුම්පත් අවශ්‍ය කරන ලිපි ලේඛන මුල් පිටපත් හා ඡායා පිටපත් සමග අයදුම්කරු විසින් කොළඹ ආගමන විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ පුරවැසි අංශයට භාර දිය හැක.

- නිසි පරිදි සම්පූර්ණ කළ ඉල්ලුම්පත්‍රය නියමිත ලේඛන හා ඒවායේ සහතික කරන ලද පිටපත් විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාලයට භාර දිය හැක.

- විදේශගත ශ්‍රී ලංකා දූත මණ්ඩලයක් හරහා ඉල්ලුම්පත් භාර දෙන විට දූත මණ්ඩලයේ බලයලත් නිලධාරියකු මගින් සියලු ලිපිලේඛන සහතික කරගත යුතු අතර එම නිලධාරියාගේ අත්සන සහ රබර් මුද්‍රාව එහි සටහන් විය යුතුය.